# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## ශාස්ත්‍ර පීඨය

**ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය – 2017/2018**

**SOC 2269 – දුගීකම හා සමාජ බහිෂ්කරණය පිළිබඳ අවදානමට බඳුන්වන සමූහ සම්බන්ධ සමාජ කාර්යවේදය**

**පැ දෙකයි (02)**

**ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න**

***විභාග ශාලාව තුළදී කේන්ද්‍ර සටහන් පොත පරිශීලනය කිරීමට අවසර ලැබේ***

---

1. සමාජ බහිෂ්කරණය යන්න නිර්වචනය කර එහි බහුමානීය සාධක නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

2. සමාජ කාර්යවේදීය භාවිතාව තුළ දරිද්‍රතාවෙහි ස්වරූපය හඳුනාගැනීම කෙරෙහි ශාඛ්‍යතා විහීනතාව පිළිබඳ ප්‍රවේශයේ (Capability - Deprivation Approach) වැදගත්කම නිදසුන් සහිතව විභාග කරන්න.

3. මානසික සෞඛ්‍යය ගැටලු සහිත පුද්ගලයින් සමාජ බහිෂ්කරණයට ලක්වන විවිධ සමාජ තල නිදර්ශන ඇසුරෙන් පැහැදිලි කරන්න.

4. සමාජ බහිෂ්කරණයට බඳුන්වීමේ අවදානමක් සහිත පුද්ගලයින්ගේ මූලික අයිතිවාසිකම් හා ගරුත්වය සුරක්ෂිත කිරීමේ විධික්‍රමයක් වශයෙන් සමාජ කාර්යවේදීය භාවිතාව තුළ අධිවාචනය (Advocacy) යොදා ගත හැක්කේ කෙසේදැයි නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

5. ආබාධ සහිත පුද්ගලයන් සමාජ බහිෂ්කරණයට ලක්වන ආකාරය පැහැදිලි කර අන්තර්කරණය (inclusion) සඳහා සමාජ කාර්යවේදියාගේ කාර්යභාර්ය දායක වන්නේ කෙසේදැයි විභාග කරන්න.

6. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම <u>**දෙකක් (02)**</u> පිළිබඳ කෙටි රචනා ලියන්න.

   i ආයතනගතකරණය හා සමාජ බහිෂ්කරණය

   ii දුගීකමේ සංස්කෘතිය

   iii සමාජ බහිෂ්කරණය කෙරෙහි බලපාන ව්‍යුහාත්මක සාධක

   iv සමාජ ප්‍රතිපත්ති හා සමාජ අන්තර්කරණය

*************